අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- කිසිවිටෙක තම අතින් කිසිවකුට හෝ බිරියකට හෝ සේවකයකුට හෝ පහර දී නැත. නමුත් එතුමා (අල්ලාහ්ගේ මාර්ගයේ) සටන් වැඳුණහ.

ආඉෂා -රළියල්ලාහු අන්හා- තුමිය විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. "අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- කිසිවිටෙක තම අතින් කිසිවකුට
හෝ කාන්තාවකට හෝ සේවකයකුට හෝ පහර දී නැත. නමුත් එතුමා අල්ලාහ්ගේ මාර්ගයේ
සටන් වැඳුණහ. එමෙන්ම එතුමාට කිසිවක් අත් වූ විට එම පුද්ගලයාට දඬුවම් කළහ. එය ඔහු අල්ලාහ්ගේ සීමාවන් උල්ලංගණය කර ඇති බැවිනි එවිට එතුමා අල්ලාහ් වෙනුවෙන් දඬුවම්
කළහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාගේ ගුණාංග අතුරින් එකක් වනුයේ, කිසිදු විටෙක කිසිදු අවස්ථාවක එතුමා කිසිදු සත්වයකුට පහර දුන්නේ නැත.එමෙන්ම බිරියට හෝ සේවකයාට හෝ පහර දුන්නේ නැත. පොදුවේ බහුතර දෙනාගේ පුරුද්ද මේ දෙවර්ගයට පහර දීමය. මෙසේ තිබියදී නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා කිසිවිටෙක මේ දෙවර්ගයට පහර දී නැත. අල්ලාහ්ගේ වචනය උසස් කරනු පිණිස අල්ලාහ්ගේ මාර්ගයේ අරගල කිරීමක් ලෙසින් මිස එසේ පහර දීම පුරුද්දක් ලෙස නොගත් අය උතුම් බව පවසා එය වෙනස් කළහ. කිසිවකුගෙන් යම් බරපතල වරදක් සිදු වූ විට ඔහුට දඬුවම් දුන්හ. උදහරණයක් ලෙස හිස පොඩි කරමින් මිනිසකු ඝාතනය කළ දේව ප්රතික්ෂේපකයාට එවැනිම දඬුවමක් නබි තුමාණන් දී ඇත්තාහ. එමෙන්ම විටෙක නොසලකා හැර සමාව දුන්හ. දඬුවම් නොකළහ. එය අල්ලාහ්ගේ සීමාවන් නොඉක්මවූ කාර්යයන්හීය. හේතුව එය කිසිවකුට පිළිගත හැක්කක් නොවන බැවිනි.

http://www.sunnah.global/hadeeth/si/show/6391